දිවි තොර කරගැනීම් යනු සමාජ ගැටළුවක් බව පෙන්වා දීම සඳහා එවැනි සිදුවීම් වාර්තා කිරීම අවශ්‍ය වන නමුදු, ඒ ඔස්සේ තවත් එක් අනුකාරක දිවි තොර කරගැනීමකට හෝ අනුබලයක් ලබා නොදීම උදෙසා, දිවි තොර කරගැනීම් වාර්තාකරණයේදී අවශ්‍ය මාධ්‍ය ආචාර ධර්ම පිළිපදින මෙන්, Ethics Eye අපි නිරන්තරයෙන්ම මාධ්‍ය වෙත සිහිකැඳවීම් කරමු.

මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල දිවි තොරකරගැනීම් වාර්තා කළ යුත්තේ මන්ද යන කරුණ සඳහා, පහත දැක්වෙන පුවත් වාර්තාවන් ඊට උදාහරණ සපයයි. (ජනවාරි 19 20 සහ 27 දිනයන්හි දිවයින පුවත්පත් ඇසුරිණි.)

1) මෙහි දිවි තොර කරගත් ආකාරයන් සඳහන් කර ඇත. ඒ ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකු එම ආකාරය භාවිතා කිරීමට පෙළඹීමේ හැකියාවක් ඇත.

2) උපකාරක අංක සඳහන් කර නැත. හදිසි උපකාරක අංක සඳහන් කිරීම මගින් දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයක් ඇති අයෙකු උපදේශන සේවාවන් වෙත යොමු වීමට ඉන් පෙළඹීමේ හැකියාවක් ඇත.

මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව දිවි තොරකරගැනීම් වාර්තා කිරීම ඔස්සේ, තවත් ජීවිතයක් බේරා ගැනීමට හැකියාවක් ලැබිය හැක. එය මාධ්‍ය වගකීමක් ද වනු ඇත.

හදිසි උපකාරක අංක:
CCCline - 1333
ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවිඩ මාර්ගයෙන් සම්බන්ධ කර ගත හැක)


මූලාශ්‍ර:
https://media.samaritans.org/.../Samaritans_Media...
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...